- සංවර්ධනය යනු ගතික සංකල්පයකි.ඉටු කරගෙන අවසන් කල නොහැකි අඛණ්ඩ ක්‍රියාදාමයකි.
- 20 වන සියවසේදී රටක පැවති ආර්ථික දියුණුව සංවර්ධනය ලෙස සලකන ලදී.
- 20 වන සියවස අග භාගය වනවිට ආර්ථිකමය තක්සේරුවක් පමණක් නොව මානුෂ සංවර්ධනය පිලිබඳවද අවධානය යොමු කරන ලදී.
- සංටර්ධනයේ මුල් කාලීන මිණුම්
    - ඒක පුද්ගල ආදායම
    - ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය
    - දළ දේශීය නිෂ්පාදිතය
    - මිනිසුන් 1000 කට ඇති ගුවන්විදුලි සංඛ්‍යාව
    - මිනිසුන් 1000 කට ඇති දුරකතන සංඛ්‍යාව
- 20 වන සියවස අගභාගයේදී සංවර්ධන මිනුම්
    - ළදරු මරණ අනුපාතිකය
    - මාතෘ මරණ අනුපාතිකය
    - සාක්ෂරතාව
    - උපතේදී ආයු අපේක්ෂාව
    - සෞඛ්‍යය පහසුකම්
    - තොරතුරු සන්නිවේදන අවස්ථා
    - ආදායම් විෂමතා ඉවත්වීම
    - අධ්‍යාපන අවස්ථා පුළුල් වීම
    - දේශපාලන තීරණ ගැනීමේ නිදහස
    - භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හැකියාව

- 1978 යුනෙස්කෝ සංවිධානය සහ 1981/90 එක්සත් ජාතීන්ගේ සංවිධානය සංවර්ධනය පිලිබදව නිර්වචන ඉදිරිපත් කර ඇත.
- සංවර්ධනයේ පැරණි මිනුම්
    - මූර්ත දළ ජාතික නිෂ්පාදනය
    - ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදනය
    - දළ ජාතික නිෂ්පාදනයේ වර්ධන වේගය

- සංවර්ධනයේ නූතන මිනුම්
    - ✓ භෞතික ජීවන තත්ත්ව දර්ශකය
    - ✓ මානුෂ සංවර්ධන දර්ශකය
    - ✓ මානුෂ දරිද්‍රතා දර්ශකය
    - ✓ මානුෂ පීඩක දර්ශකය

- මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීමේදි උපතේදි ආයු අපේක්ෂාව .සාක්ෂරතාව සහ ක්‍රය හක්තිය හා ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය නිර්ණායක ලෙස යොදා ගනියි.
- මිනිසාගේ අසීමිත අවශ්‍යතාවන් හමුවේ පාරිසරික විසංතුලනයක් සිදුවෙමින් පවතී.එයට විසදුමක් ලෙස තිරසර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.
- තිරසර සංවර්ධනයේ ප්‍රධාන අරමුන වන්නේ පරිසර කළමනාකරණය සහ සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීමයි.

- ශ්‍රී ලංකාවේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාමාර්ග.
  - යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
  - මහාමාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධනය
  - ගුවන් තොටුපල හා වරාය සංවර්ධනය
  - මානව සම්පත් සංවර්ධනය
  - අධ්‍යාපන සම්පත් සංවර්ධනය
  - සෞඛ්‍ය සම්පත් සංවර්ධනය
  - ප්‍රාදේශීය සම්පත් සංවර්ධනය
  - දැනුම පදනම් කරගත් තොරතුරු හා සන්නිවේදන සංවර්ධනය
  - සංවර්ධනය

## 5 පාඩම සංවර්ධනය

## 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ක්‍රියාකාරකම් පත්

1. සංවර්ධනය යනු කුමක්ද?
2. සංවර්ධනය මැනීමට මුල් කාලීනව යොදාගත් මිනුම් මොනවාද?
3. යුනෙස්කෝ ප්‍රකාශයට අනුව සංවර්ධනය හඳුන්වන්න
4. සංවර්ධනයේ නූතන මිනුම් මොනවාද?
5. ලෝකයේ සංවර්ධන කාණ්ඩ 4 නම් කරන්න
6. සංවර්ධනයේ දී පරිසරයට ඇති කරන බලපෑම් මොනවාද?

7. වර්තමාන ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ නැඹුරුවක් දක්වන ක්ෂේත්‍ර මොනවාද?
8. මානව සම්පත් සංවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග 5 ක් ලියන්න
9. නාගරික සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 5 ක් ලියන්න

10. තොරතුරු තාක්ෂණය සඳහා දුනුම ලබා දෙන මූලාශ්‍ර මොනවාද?

# පිළිතුරු සංවර්ධනය 5 පාඩම

1.සංවර්ධනය වෙනස් වන සුළු සංකල්පයකි.එය ආර්ථික. සමාජීය, සංස්කෘතිකමය අංශයන්ගේ වෙනස්වීම් හා වර්ධනයයි.

2. * දළ දේශීය නිෂ්පාදිතය

* ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය

* ඒක පුද්ගල ආදායම

* මිනිසුන් 1000 ට ඇති ගුවන්විදුලි සංඛ්‍යාව

* මිනිසුන් 1000 ට ඇති දුරකතන සංඛ්‍යාව

3. රටක ආර්ථික සංවර්ධනය සමග සමාජීය සංවර්ධනයක්ද සිදුවිය යුතුය.එනම් ආහාර, පෝෂණය. සෞඛ්‍යය,අධ්‍යාපනය ,නිවාස,සමාජ සුරක්ෂිතතාව,ඇදුම් පැළදුම්,විවේකය,මානුෂීය නිදහස ආදී අංශයන්ගේ දියුණුවයි.

4. *භෞතික ජීවන තත්ත්ව දර්ශකය

*මානුෂ සංවර්ධන දර්හකය

* මානුෂ දරිද්‍රතා දර්හකය

* මානුෂ පීඩක දර්හකය

5. *ඉතා ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්

* ඉහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්

*මධ්‍යස්ථ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්

*පහළ මානුෂ සංවර්ධනයක් ඇති රටවල්

6. * ඕසෝන් වියනට හානි සිදුවිම

*ගෝලීය උෂ්ණත්වය වැඩිවීම

*ස්වභාවික විපත්

*දේශගුන විපර්යාස

*ජෛව සම්පතට හානි සිදුවීම

*පරිසර දූෂනය

*ග්‍රාමීය සංවර්ධනය

*නාගරික සංවර්ධනය

*අධ්‍යාපන ,සෞඛ්‍යය ,යටිතල පහසුකම්

* සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය

* මහාමාර්ග,දුම්රිය,වරාය,ගුවන් තොටුපල,අධිවේගී මාර්ග,ජාතික ආරක්ෂාව

8.ජනසවිය,සමෘද්ධි, දිවිනැගුම,ප්‍රජාමූල සෞඛ්‍යය වැඩසටහන්

9.මාර්ග පුළුල් කිරීම,පදික අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,නගර අලංකරනය,නව වෙළද සංකීර්ණ ඉදිකිරීම,නාගරික රථ ගාල් ඉදිකිරීම ආදී කරුණු

10 *.පාසල් පද්ධතියට අන්තර්ජාල පහසුකම් ඇති කිරීම

*නැණසල මධ්‍යස්ථාන පිහිටුවීම

*විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගින්

*උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව

*විදුලි සන්දේශ කොමිෂන් සභාව පත් කිරීම